සබරගමුව පළාත් සභාව - சப்பிரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council

අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாசார நடவடிக்கைகளுக்கான அமைச்சு

Ministry Of Education, Information Technology & Cultural Affairs

Email||:edusabaram@gmail.com Facebook||:SabEducationMinistry

මගේ අංකය ME/E/21(සබර/චක්‍රලේඛ) ඔබේ අංකය දිනය 2017.09.25

My Number Your Number Date

**පළාත් අධ්‍යාපන චක්‍රලේඛ අංක**

**සබර/2017/08**

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
ගණකාධිකාරීවරුන්,
සියලුම විෂය අධ්‍යක්ෂවරුන්,
අධ්‍යක්ෂ, පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය,
ස්ථානභාර නිළධාරී ,මෙනේරිපිටිය අධ්‍යාපන පුහුණු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය.
ස්ථානභාර නිළධාරී , අටුළුගම අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානය.

**පුහුණු වැඩසටහන් /වැඩමුළු/සම්මන්ත්‍රණ සංවිධානයට අදාළ ආහාරපාන සංග්‍රහ කටයුතු සඳහා අවම ප්‍රමිතිය නියම කිරීම**

2017.09.11 දිනැති පළාත් අධ්‍යාපන චක්‍රලේඛ අංක සබර/2017/07 දරණ චක්‍රලේඛය හා බැඳේ. එකී චක්‍රලේඛ අංක 09 ට අදාළ ආහාර හා සංග්‍රහ කටයුතු සඳහා පහත පරිදි අවම ප්‍රමිතීන් හා නියමයන් පනවමි.

උක්ත වැඩසටහන් හැකිතාක් රජයේ, පළාත් සභා හෝ අර්ධ රාජ්‍ය ආයතනවල පැවැත්වීමට කටයුතු කළ යුතු අතර, එම ආයතන කල්වේලා ඇතිව වෙන්කර තබා ගැනීමට කටයුතු කිරීම ද අදාළ නිළධාරීන්ගේ වගකීමක් වේ.

රජයේ, පළාත් සභා හෝ අර්ධ රාජ්‍ය ආයතනවලින් සේවා සපයා ගැනීමේ දී චක්‍රලේඛ අංක සබර/2017/07 හි අයිතම 09 ට අදාළ වියදම් සඳහා එම ආයතනවල අනුමත ආහාර වට්ටෝරුවලට අනුව ගෙවීම් කළ හැකි අතර මීට පරිබාහිරව වෙනත් ආයතනවලින් අදාළ පහසුකම් සපයා ගැනීමේ දී පවත්නා වෙළඳපොළ මිල ගණන් අනුව මිල ගණන් කැඳවා අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් ගුණාත්මක හා සාධාරණ අවම මිල ගණන් අනුව උක්ත චක්‍රලේඛයේ වියදම් සීමාවන්ට යටත්ව කටයුතු කළ යුතුය.

මෙහිදී රජයේ, පළාත් සභා හෝ අර්ධ රාජ්‍ය ආයතනවල අදාළ පුහුණු වැඩසටහන් වැඩමුළු/සම්මන්ත්‍රණ පවත්වන්නේ නම් අනිවාර්යයෙන්ම ආහාරපාන හා සංග්‍රහ කටයුතු එම ආයතනවල අනුමත ආහාර වට්ටෝරු අනුව එම ආයතනවලින්ම සේවා සපයා ගැනීම කළ යුතු අතර වෙනත් පරිබාහිර ආයතනවලින් ඇණවුම් ලබා ගැනීම නොකළ යුතුය.

ගරු අමාත්‍යතුමා Hon.Minister Office-045-5623222,045-2287306 Residence-045-2222538 Mobile-077-9102001 Fax-045-2228042

අමාත්‍යාංශ ලේකම් Secretary Office-045-2223015 Residence-045-2232985 Mobile-071-4402000 email-msweerasooriya@gmail.com

කාර්යාලය Office නවනගරය,රත්නපුර. Newtown,Rathnapura. Office-045-2222542 Fax-045-2228042

යම් සාධාරණ හේතුවක් මත පරිබාහිර ආයතනවල අදාළ වැඩසටහන් පවත්වන අවස්ථාවල රජයේ, පළාත් සභා හෝ අර්ධ රාජ්‍ය ආයතනවලින් අනුමත මිල ගණන් මත ආහාරපාන පහසුකම් සලසා ගත හැකිය.

රජයේ, පළාත් සභා හෝ අර්ධ රාජ්‍ය ආයතනවල යම් සාධාරණ හේතුවක් මත අදාළ වැඩසටහන් පැවැත්වීමට නොහැකි අවස්ථාවල පරිබාහිර ආයතනවල පවත්වන එක් දින වැඩසටහන් සඳහා අදාළ ආහාර වට්ටෝරු පිළිබඳව පහත අවම ප්‍රමිතීන් හා නියමයන් පනවන අතර, ඒ අනුව කටයුතු කළ යුතුය.

**නේවාසික නොවන එක් දින පුහුණු වැඩසටහන් /වැඩමුළු/සම්මන්ත්‍රණ**

| | | | | |
|---|---|---|---|---|
| 01. | උදේ ආහාර | - රු | 160.00 | රු 600.00 |
| 02. | පෙ.ව 10.00 ට තේ | - රු | 110.00 | |
| 03. | දිවා ආහාරය | -රු | 270.00 | |
| 04. | සවස තේ | -රු | 60.00 | |

උක්ත ආහාරවේල් වලට අදාළව අවම ආහාර වට්ටෝරුව සඳහා ප්‍රමිතිය

**01.උදේ ආහාර රු 160.00**

- පිටිවලින් සකස් කරන ලද ආහාර වර්ග 02ක් / ධාන්‍ය වර්ග 02ක් හෝ සුදු බත්/රතු බත්/සම්බා බත්
- බිත්තර/සැමන්/මාළු/මස්
- අල/පරිප්පු හෝ සුදුසු ව්‍යංජනයක්
- පොල් සම්බෝල/කට්ට සම්බෝල
- සාමාන්‍ය තේ එකක්
- කුඩා වතුර බෝතලයක් (අවම 500ml)

Paper serviette සමග සැපයිය යුතුය.

**02. පෙ.ව. 10.00 ට තේ රු. 110.00**

- කැවිලි වර්ග 02ක් සමග කිරි තේ/ කිරි කෝපි/සිසිල් බීම හෝ කිරි පැකට් එකක් සමග කැවිලි වර්ග 02ක්

**03. දිවා ආහාරය රු. 270.00**

- රතු/සුදු/සම්බා බත්
- කුකුළු මස්/මාළු/බිත්තර/සැමන්
- එළවළු වර්ග 02ක් අල/පරිප්පු සමග
- මැල්ලුම්/සලාද/සම්බෝල
- පපඩම්

අතුරුපස- අයිස්ක්‍රීම්/ජෙලි/යෝගට්/වටලප්පන්/පළතුරු

- කුඩා වතුර බෝතලයක් (අවම 500ml)

Paper serviette සමග සැපයිය යුතුය.

**<u>04. සවස තේ රු.60.00</u>**

- කැවිලි වර්ග 01 ක්
- කිරි තේ/තේ/අයිස් කෝපි/පළතුරු බීම

  Paper plate හා paper serviette සමග සැපයිය යුතුයි.

නේවාසික වැඩසටහන් පැවැත්වීම අනිවාර්යයෙන්ම රජයේ, පළාත් සභා හෝ අර්ධ රාජ්‍ය ආයතනවල පමණක් විය යුතු බවත්, ආහාර පාන එම ආයතනවල අනුමත වට්ටෝරු අනුව ලබා ගත යුතු බවත්, අවධාරණය කරන අතර යම් හේතුවක් මත ඉන් පරිබාහිරව පැවැත්වීමට සැලසුම් කරන්නේනම් මා මගින් ප්‍රධාන ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු බවද දන්වමි.

❖ මෙම චක්‍රලේඛය 2017 සප්තැම්බර් 26 වන දින සිට වලංගුවේ.

Ministry of Provincial Education
Sabaragamuwa

මහින්ද එස් වීරසූරිය.
ලේකම්,
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.
සබරගමුව පළාත් සභාව.

O/C

මහින්ද එස්. වීරසූරිය
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව,
නව නගරය - රත්නපුර.

පිටපත් -

| | | |
|---|---|---|
| 01. ප්‍රධාන ලේකම් - සබරගමුව පළාත් සභාව | - | දැ.පි |
| 02. පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම මාණ්ඩලික නිළධාරීන් | - | දැ.ගැ.ස |
| 03. සහකාර විගණකාධිපති - සබරගමුව පළාත. | - | දැ.ගැ.ස |
| 04. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ - සබරගමුව පළාත් සභාව | - | දැ.පි |
| 05. විගණන අධිකාරී - රත්නපුර/කැගල්ල | - | දැ.පි |